# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 2077/46 - 2018 ජුනි මස 29 වැනි සිකුරාදා - 2018.06.29

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡේදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### රේගු නිවේදනයයි

රේගු (සංශෝධිත) ආඥාපනතේ (235 වන අධිකාරය) 101(1) වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව මංගල සමරවීර වන මම, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යවරයා වශයෙන් ඊ වාණිජ තලයක් හරහා ව්‍යාපාර සිට පාරිභෝගික ගනුදෙනු පාලනය කිරීමේ කාර්යය සඳහා මෙමගින් නියෝග පනවනු ලැබේ. මෙම නියෝග 2018 ජූලි මස 01 වැනි දින සිට බලාත්මක වේ.

මංගල සමරවීර,<br>
මුදල් හා ජනමාධ්‍ය අමාත්‍ය,

2018 ජුනි මස 29 වැනි දින,<br>
මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශය,<br>
කොළඹ.

### නියෝග

1. මෙම නියෝග (ව්‍යාපාර සිට පාරිභෝගික) නියෝග ලෙස හඳුන්වනු ලබන අතර 2018 ජූලි මස 01 වැනි දින සිට බලාත්මක වේ.

2. අන්තර්ජාලය හෝ වෙනත් මාර්ගස්ථ වාණිජ තලයක් ඔස්සේ පහත දැක්වෙන ව්‍යාපාර සිට පාරිභෝගික ගනුදෙනුවක් නියාමනය කිරීම මෙම නියෝගවල අරමුණ වේ.

   (අ) ආයෝජන මණ්ඩලය මගින් අනුමත කේන්ද්‍රස්ථාන ව්‍යවසායන් (Hub Enterprise) විසින් සිදු කරන (ව්‍යාපාර සිට පාරිභෝගික) මෙහෙයුම්

   (ආ) ඉහත (අ) යටතේ වන ව්‍යවසායන් හැර ආයෝජන මණ්ඩලය මගින් අනුමත ව්‍යවසායන් විසින් සිදු කරන (ව්‍යාපාර සිට පාරිභෝගික) මෙහෙයුම්

   (ඇ) අනෙකුත් ලියාපදිංචි ව්‍යාපාර ව්‍යවසායන් විසින් සිදු කරන ව්‍යාපාර සිට පාරිභෝගික මෙහෙයුම්

   (ඈ) අනෙකුත් තනි පුද්ගල අපනයනකරුවෙක් විසින් සිදු කරන ව්‍යාපාර සිට පාරිභෝගික මෙහෙයුම්

1A - PG 4126— 532 (2018/07)

*මෙම අති විශේෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

2.1 ඉහත 2(අ) සිට 2(ඇ) හි දක්වා ඇති ව්‍යාපාර සිට පාරිභෝගික ව්‍යාපාර/මෙහෙයුම්වල නියැලි ව්‍යවසායන්/පුද්ගලයින්ට පහසුකම් සැලසීම සඳහා වන සාමාන්‍ය ප්‍රතිපාදන හා ක්‍රියාමාර්ග

(i) ඊ වාණිජ තලයක් හරහා භාණ්ඩ සඳහා ඇණවුමක් ලැබීමෙන් පසුව අදාළ ව්‍යවසායන් මගින් භාණ්ඩ ගෙන ඇසුරුම් කර ඒවා අදාළ පරිදි ගබඩා කළමනාකරණ පද්ධතියෙන් හෝ තොග කළමනාකරණ පද්ධතියේ ඇති තොගයෙන් හෝ භාණ්ඩ වට්ටෝරු කළමනකරණ පද්ධතියෙන් අඩු කළ යුතු ය.

(ii) ව්‍යාපාර සිට පාරිභෝගික මෙහෙයුම්වල නියුතු තනි පුද්ගල අපනයනකරුවෙකු ඇතුළු අදාළ ව්‍යවසායන් විසින් එකි භාණ්ඩ නැව්ගත කිරීමට ප්‍රථම.

(අ) නැව්බඩු තොගයේ නිවැරදි තොරතුරු ඇතුළුව විශේෂ අනුක්‍රමික අංක (AMW අංකය) සහිත කුරියර් ගුවන් ගමන් බිල්පත හා බඩු භාරගත යුතු තැනැත්තා හා

(ආ) එකී භාණ්ඩ අපනයනය සඳහා වන ඉන්වොයිසිය පිළියෙල කළ යුතු ය.

(iii) බලයලත් කුරියර් නියෝජිතායතනය/සමාගම විසින් අදාළ ව්‍යවසායක පරිශ්‍රයෙන් එකී පැකේජ ලබාගත යුතු අතර GSM තාක්ෂණය හරහා එසැණින් ක්‍රියාත්මක වන කුරියර් නියෝජිතායතනයේ/සමාගමේ කළමනාකරණ පද්ධතියට ඇතුළත් කළ යුතු AMW අංකය පරිලෝකනය කළ යුතු ය.

(iv) අපනයන සැකසුම් කලාපය ඇතුළ පිහිටි කේන්ද්‍රස්ථාන ව්‍යවසායන් ඇතුළු ආයෝජන මණ්ඩල ව්‍යවසායන් විසින් ලියාපදිංචි කුරියර් නියෝජිතයතනයක්/සමාගමක් හරහා ව්‍යාපාර සිට පාරිභෝගික පදනම් අපනයනයන් සිදු කිරීමට අදහස් කරන භාණ්ඩ සඳහා ඍජු මාර්ගගත ප්‍රවේශ අවසරපත් (අවසර පත් 03) සකස් කළ යුත්තේ ය.

(v) අදාළ ආයතනය විසින් එකී ප්‍රවේශ අවසරපත් තබාගත යුතු අතර එක් එක් අවසරපතෙහි පිටපතක් ශ්‍රී ලංකා රෙගුවට හා ව්‍යාපාර සිට පාරිභෝගික ව්‍යාපාර/මෙහෙයුම් යටතේ එකී කුරියර් නියෝජිතායතනය/සමාගම හරහා අපනයනය සඳහා භාණ්ඩ රැගෙන යන අවස්ථාවේදී අපනයන සැකසුම් කලාපවල නම් කරන ලද පිටවීමේ ගේට්ටු භාර ආයෝජන කලාපීය නිළධාරින්ට භාරදිය යුතු ය. එසේ කළ ද, අපනයන සැකසුම් කලාප තුළ ප්‍රවේශ අවසරපත් අතින් නිකුත් කිරිමේ පද්ධතිය 2019 මාර්තු මස 31 දින දක්වා අඛණ්ඩව පවත්වාගෙන යනු ඇත.

(vi) අපනයන සැකසුම් කලාපවලින් පිටත පිහිටා ඇති ආයෝජන මණ්ඩල ව්‍යවසායන් ඇතුළු කේන්ද්‍රස්ථාන ව්‍යවසායන් සැළකු විට, අදාළ ව්‍යවසායකයේ පිටවීමේ ගේට්ටුවේ රඳවාගත යුතු වන තනි ප්‍රවේශ අවසර පත ජනනය කළ යුතු ය.

(vii) අදාළ ව්‍යවසායන් විසින් අපනයනයක් සිදු කරනු ලබන අවස්ථාවේදී ව්‍යාපාර සිට පාරිභෝගික ව්‍යාපාර/මෙහෙයුම් හරහා යවනු ලබන කුරියර් නැව්බඩු තොග සඳහා රේගුවේ ප්‍රකාශයන් ඉදිරිපත් කිරිම අවශ්‍ය නොවන නමුත් සෑම මසකම අවසානයේ අදාළ ව්‍යවසයකයා විසින් ලියාපදිංචි කුරියර් නියෝජිතායතනයක්/සමාගමක් හරහා ව්‍යාපාර සිට පාරිභෝගික මෙහෙයුම් යටතේ සිදුකරනු ලබන මාසික අපනයන සාරාංශ කරමින් ශ්‍රී ලංකා රේගුවේ ASYCUDA පරිගණක පද්ධතිය සඳහා සම්පූර්ණ බඩු තොග සඳහා CusDec ඉදිරිපත් කළ යුතු වන්නේ ය. එකී අපනයනය රේගු සටහන් කරය (CusDec) රටවල් වශයෙන් වෙන් වෙන්ව පිළියෙල කළ යුතුය. ඊට අමතරව, ඉහත 2(ඇ) හි ඇති නියෝගවල දක්වා ඇති තනිපුද්ගල ව්‍යවසායන් සැළකීමේදී සෑම මසකම අවසානයේ අදාළ තනිපුද්ගල ව්‍යවසායකයා විසින් එකී කුරියර් නියෝජිතායතන/සමාගම් හරහා සිදුකරනු ලබන මාසික අපනයනයන් සාරාංශගත කරමින් ශ්‍රී ලංකා රේගුවේ ASYCUDA පරිගණක පද්ධතියට සම්පූර්ණ බඩුතොග සඳහා CusDec ඉදිරිපත් කළ යුතු ය.

(viii) කුරියර් නියෝජිතායතන/සමාගම් විසින් නම් කරන ලද ගිණුම් හරහා පමණක් ව්‍යාපාර සිට පාරිභෝගික ව්‍යාපාර/මෙහෙයුම් සඳහා ඉඩදෙනු ලබන අතර එකී ව්‍යවසායන්/තනිපුද්ගල අපනයනකරුවන් සඳහා කුරියර් බිල්පත් හා භාණ්ඩවල විස්තරය සඳහන් කරමින් මාසික සාරාංශ වාර්තාවේ ඩිජිටල් ලෙස අත්සන් කරනු ලැබූ මෘදු පිටපතක් ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයට හා ශ්‍රී ලංකා රේගුවට ඉදිරිපත් කළ යුතු ය. කුරියර් නියෝජිතායතන/සමාගම් විසින් වසර 05ක කාලයක් සඳහා ව්‍යාපාර සිට පාරිභෝගික අපනයන විස්තර ඔවුන්ගේ පද්ධතිය තුළ රඳවා තබා ගත යුතු අතර ඉල්ලා සිටිනු ලබන්නේ නම් ශ්‍රී ලංකා රේගුවට හා වෙනත් රජයේ ආයතනවලට එකී තොරතුරු ලබාදිය යුතු වේ.

2.2 පහත දක්වා ඇති විශේෂිත ව්‍යවසායන් හෝ පාර්ශව සම්බන්ධයෙන් පහත දැක්වෙන විශේෂ විධිවිධාන අදළ වේ.

(අ) ව්‍යාපාර සිට පාරිභෝගික මෙහෙයුම්/ව්‍යාපාරවල නිරත කේන්ද්‍රස්ථාන ව්‍යවසායන් සතුව ගබඩා කළමනාකරණ පද්ධති තිබිය යුතු ය.

(ආ) ව්‍යාපාර සිට පාරිභෝගික මෙහෙයුම්/ව්‍යාපාරවල නිරත ආයෝජන මණ්ඩල ව්‍යවසායන්ට ඔවුන් සතුව ගබඩා කළමනාකරණ පද්ධති හෝ බඩු වට්ටෝරු කළමනාකරණ පද්ධති තිබිය යුතු ය.

3. (අ) කේන්ද්‍රස්ථාන ව්‍යවසායන් (Hub Enterprises)
(ආ) ආයෝජන මණ්ඩල ව්‍යවසායන්
(ඇ) දේශීය ව්‍යවසායන් හා තනි පුද්ගල අපනයනකරුවන්ගේ

ව්‍යාපාර සිට පාරිභෝගික මෙහෙයුම්/ව්‍යාපාර සිට පාරිභෝගික අපනයන සඳහා පහසුකම් සැලසීමට අදල දෙපාර්තමේන්තු නියෝග (DOPL) සමගින් ශ්‍රී ලංකා රේගුව විසින් විශේෂිත රේගු ක්‍රම කේතාංක තුනක් ප්‍රකාශයට පත් කළ යුතු ය.

3.1 රේගු ආඥාපනතේ (235 වන අධිකාරය) ''බී'' උපලේඛනයේ ඇති සංචලනය හා වෙළඳාම තහනම් කරන ලද හෝ සීමා කරන ලද භාණ්ඩ ව්‍යාපාර සිට පාරිභෝගික මෙහෙයුම්/ව්‍යාපාර හරහා වෙළඳාම් නොකළ යුතු ය.

3.2 බඩු තොගයේ වටිනාකම ඇ. ඩො. 3,000ට වැඩි අගයක් ගන්නා භාණ්ඩ ව්‍යාපාර සිට පාරිභෝගික මෙහෙයුම්/ව්‍යාපාර හරහා වෙළඳාම් නොකළ යුතු ය.

3.3 ව්‍යාපාර සිට පාරිභෝගික/මෙහෙයුම්/පහසුකම් වංචනික ලෙස යොදගනු ලබන්නේ නම්, රේගු ආඥාපනතට (235 වන අධිකාරය) අනුකූලව කටයුතු කරනු ලැබේ.

3.4 ව්‍යාපාර සිට පාරිභෝගික මෙහෙයුම් සම්බන්ධීකරණය හා අධීක්ෂණය කිරීම රේගු අධ්‍යක්ෂ (කාර්මික හා සේවා) යටතේ සිදු කළ යුතු ය. නමුත් ඉහත 2(අ) හා 2(ආ) හි දක්වා ඇති ව්‍යාපාර සිට පාරිභෝගික මෙහෙයුම්වල දී ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය ශ්‍රී ලංකා රේගුව සමග සම්බන්ධීකරණය කිරීම හා පහසුකම් සැලසීම කළ යුතු ය.

4. නියෝගවල කාර්යයන් සඳහා

(අ) ''ව්‍යාපාර සිට පාරිභෝගික'' යනු මෙම නියෝගවල 2(ආ) සිට (ඈ) දක්වා හඳුනාගෙන ඇති කිසියම් පුද්ගලයෙකු හා මෙහි අවසාන පරිශීලකයා වන වෙනත් රටක/රටවල්වල පාරිභෝගිකයන් අතර සෘජුව සිදුකරනු ලබන ගනුදෙනු වේ.

(ආ) ''කේන්ද්‍රස්ථාන ව්‍යවසායන් '' යනුවෙන් ශ්‍රී ලංකාවේ ස්ථාපිත හෝ සංස්ථාගත කරනු ලැබූ ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය විසින් අනුමත කරනු ලැබූ හා කලින් කලට සංශෝධනය කරනු ලැබූ 2013 අංක 01 දරන මූල්‍ය පනතේ වාණිජ කේන්ද්‍රස්ථාන නියෝගයන්හි දක්වා ඇති ව්‍යාපාරික ක්‍රියාකාරකම් එකක හෝ එකකට වැඩි ගණනක නිරත වූ ව්‍යවසායකයන් අදහස් වේ.

(ඇ) ''ආයෝජන මණ්ඩල ව්‍යවසායන් '' යනුවෙන් ඉහත (ආ) යටතේ දක්වා ඇති කේන්ද්‍රස්ථාන ව්‍යවසායන් හැර කලින් කලට 1978 අංක 04 දරන ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල නීතියේ 17 වන වගන්තිය යටතේ අනුමත කරන ලද හා භාණ්ඩ නිෂ්පාදනය හෝ වෙළඳාමේ නියැලී ව්‍යවසායන් අදහස් කෙරේ.

(ඈ) ''වෙනත් කිසියම් ලියාපදිංචි ව්‍යාපාර ව්‍යවසායක් '' යනුවෙන් සම්පූර්ණ හිමිකම (Sole Proprietorship) ඇතුළුව සමාගම් ලේකම් යටතේ ශ්‍රී ලංකාවේ ලියාපදිංචි වී ඇති ඉහත (ආ) හා (ඇ) යටතේ සඳහන් සමාගම් හැර වෙනත් සමාගම් අදහස් කෙරේ.

(ඉ) ''තනිපුද්ගල අපනයනකරු '' යනුවෙන් ශ්‍රී ලංකාවේ සාමාන්‍ය පුද්ගලයෙකු අදහස් කෙරේ.

08 - 119

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.